# 6

## සැබෑ ක්‍රිස්තියානි සභාව කුමක්ද?

SINHALI
GREAT QUESTIONS



පිළිබඳ

# ප්‍රධාන ප්‍රශ්න

# දයාබර මිතුර

''ජීවිතය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න'' නමැති අප පාඩම් පෙළෙහි මෙම අවසාන පාඩම හැර අනික් පාඩම් සියල්ලම ඔබ අවසාන කර තිබීම ගැන අපි සතුටු වෙමු. ඔබ මෙම පාඩම් පෙළ අවසාන කිරීමට අධිෂ්ඨානය කර ගැනීම ගැනත් එය ඉතා උනන්දුවෙන් ඉටු කිරීම ගැනත් අපි ඔබට ප්‍රශංසා කරමු. මෙම පාඩම අවසන් කළ විගසම අපි ඔබට අලංකාර සහතිකයක් තැපැල් කර එවමු.

ඔබේ පෞද්ගලික සාක්ෂිය දැන ගැනීමට අපි ඉතාමත් කැමැත්තෙන් සිටිමු. මේ පාඩම්වලින් ඔබට ලැබුණු උපකාරය කුමක්ද යන්න එකොළොස් වැනි පිටුවෙහි ලියා අප වෙත එවන්නේ නම් කෘතඥ වෙමු. එය දැනගැනීම අපහට ප්‍රීතියට කරුණක් වේ.

ඔබේ පහසුව තකා අපි ලියාපදිංචි වීමේ තවත් පෝරමයක් මේ සමගම ඔබ වෙත එවා ඇත්තෙමු. මෙතෙක් කර නොමැති නම් ඊළඟ පාඩම් පෙළට දැන්මම ලියාපදිංචි වන්න. ඔබේ ඉදිරියට යෑම අත්පසු නොවන පිණිස අපි එයට නොපමාව පිළිතුරු සපයන් නෙමු.

මෙම පාඩම් මාලාවලින් එකක් කිරීමට කැමති වියහැකි ඔබේ මිතුරන්ගේ නම් සහ ලිපිනයන් අප වෙත එවීමට අමතක නොකරන්න. මෙම පාඩම් වලින් ඔබේ මිතුරන්ද ආශීර්වාද ලබනවා ඇත.

ඔබව ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍ය පිරිසට ඇතුළත් කිරීමට අවස්ථාව ලැබීම සත්‍ය වශයෙන්ම අපට ප්‍රීතියට කාරණයක් විය. ඔබ තව දුරටත් ඉගෙන ගන්නවා ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. ඔබ නැවත අප වෙත ලියන තෙක් අපි ඉතා ආශාවෙන් බලා සිටිමු.

— අධ්‍යක්ෂක,

මෙහි සම්පූර්ණ අයිතිය ජාත්‍යන්තර තැපැල් මාර්ගික

6 වැනි පාඩම

# සැබෑ ක්‍රිස්තියානි සභාව කුමක්ද?

ඔබ මෙම පාඩමෙන් ඉගෙන ගන්නා දේවල් නම්:

- 'සභාව' යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
- සැබෑ සභාවෙහි කාර්යය කුමක්ද?
- සභාවකට අයත්විය යුත්තේ මන්ද?
- සභාවට කුමක් සිදුවීගෙන යන්නේද?

පළමු වැනි කොටස

## 'සභාව' යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

සභාව යන වචනය නොයෙක් අයුරින් අර්ථ ගෙනදේ.

**ක්‍රිස්තුස්වහන්සේට අයිති වන අය**

''මාගේ සභාව ගොඩ නගන්නෙමි''යි යේසුස්වහන්සේ කී සේක. උන්වහන්සේ ''සභාව'' යන වචනයට ''එක්-ලීසියා'' නමැති ග්‍රීක් වචනය පාවිච්චි කළ සේක. මෙයින් අදහස් කරන්නේ ''පිටතට කැඳවනු ලැබූවෝ'' යනුයි. ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේව අනුගමනය කිරීම පිණිස අප පිටතට කැඳවන සේක. අපගේ කලින්වූ පාපිෂ්ඨ ජීවිතය අතහැරදමා යේසුස්වහන්සේ ඔවුන්ගේ හිස ලෙස පිළිගන්නාවූ පිටතට කැඳවනු ලැබූවන්ගෙන් සෑදී තිබෙන්-නාවූ ශරීරයට අපි සාමාජිකයින් මෙන් එක්වමු. මෙය සැබෑවූ සභාව වේ. එහි සාමාජිකයින් සියලු දෙනාම කවුරුන්දැයි දන්නේ දෙවියන්වහන්සේ පමණි. ඔවුන් ගෙන් බොහෝ දෙනා දැනටමත් ස්වර්ගයෙහි වෙත්.



**කොලොස්සි 1 : 18** උන්වහන්සේ සභාව නැමති ශරීරයට හිසව සිටින සේක. උන්වහන්සේ පටන්ගැන්මව .........සිටින සේක.

**රෝම 12 : 5** බොහෝ දෙනෙක්වූ අපිත් ක්‍රිස්තුස්වහන්සේ තුළ එසේම එක ශරීරයක්ව වෙන් වෙන් වශයෙන් ඔවුනොවුන්ගේ අවයවයෝ වෙමු.

**ප්‍රාදේශීය සභාවන්**

බයිබලීය කාලයේදී මෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල ඇති කවර සමාජයක අය වුවද උන්වහන්සේට නමස්කාර කරන පිණිස නියමිත වේලාවන්හිදී නොකඩවා රැස්වේ. ඔවුහු ප්‍රාදේශීය සභාවන් ලෙස සෑදී ස්වාමීන් වහන්සේ උදෙසා එක්සත්ව වැඩ කරත්.



**මතෙව් 18 : 20** දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටිත් නම් මම එතැන ඔවුන් සමග සිටිමි.

**කොලොස්සි 4 : 15** ලවොදිකයෙහි සිටින සහෝදරයන්ටත් නිම්පස්ටත් ඔවුන්ගේ ගෙදර තිබෙන සභාවටත් ආචාර කරපල්ලා.

**ජාතික සභාව නොහොත් නිකාය.**

ජාතික සභාව නැතහොත් නිකාය යනු ප්‍රාදේශීය සභාවන් බොහොමයකින් සෑදෙන සංවිධානයකි. එම සභාවෝ එකිනෙකාට උපකාර කරත්. තවද ඔවුහු වෙන් වෙන්ව ක්‍රියා කරනවාට වඩා සාමූහිකව ක්‍රියා කිරීමෙන් විශාල වැඩ කොටසක් ඉටු කරත්. ඔවුහු සාහිත්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, සේවකයින් පුහුණු කිරීම, අළුත් සභාවන් පිහිටුවීම, පාසැල් සහ අනාථ මඩම් පවත්වාගෙන යෑම ආදී සේවයන් කරගෙන යනු ලබත්.

ජාතික සභාවේ නැතහොත් නිකායේ නායකවරු බයිබලීය කාලයේදී ප්‍රේරිතවරු කළාක්මෙන් ප්‍රාදේශීය සභාවල අවශ්‍යකම් වලදී සහයෝගය දෙත්.



**ක්‍රියා 15: 6, 23.41** ප්‍රේරිතයෝද වැඩිමහල්ලෝද මේ කාරණාව ගැන කල්පනා කර බලන පිණිස රැස්වූහ.... ............ ඔවුන් .................... මෙසේ ලියා යැව්වෝය...........ඔහු සභාවන් ස්ථිර කරමින් සිරියාව සහ කිලිකියාව මැදින් ගමන් කළේය.

විවිධ නිකායයන් ඇති වී තිබෙනුයේ නමස්කාරයට නිසි පිළිවෙල සම්බන්ධවද, සභාවේ සංවිධානයෙහි හොඳම පිළිවෙල සම්බන්ධවද, බයිබලයේ සමහර කොටස්වල අර්ථය සම්බන්ධවද, විවිධාකාරව පිළිගන්නා හෙයිනි. කෙසේ නමුත් නිකායයන් බොහොමයක් ඉතාම වැදගත් කාරණා ගැන එකඟවේ. තවද නමස්කාරයේදීත් සහභාගී වේ.

**සභා ගොඩනැගිලි**

දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේව සම්මුඛ වීමට රැස්වෙන්නාවූ දෙවියන්වහන්සේගේ ගෘහය යනුවෙන් වෙන්කර තිබෙන්නාවූ ගොඩනැගිල්ල දේවස්ථානය (පල්ලිය) නමින් හැඳින්වේ. එය අලංකාර මන්දිරයක් හෝ කුඩා වාම් ගොඩනැගිල්ලක් විය හැකියි. ඇත්තෙන්ම වැදගත්වන්නේ ඒ ස්ථානයෙහි දෙවියන්වහන්සේගේ වැඩ සිටීමය.

## ඔබේ අභ්‍යාසය සඳහා

● සෑම ප්‍රශ්නයකටම එකම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

● ''මාගේ සභාව ගොඩ නගන්නෙමි'' යනුවෙන් යේසුස්වහන්සේ කවර ආකාර සභාවක් සම්බන්ධව කීසේක්ද?

අ. ජාතික සංවිධානයක්

ආ. ක්‍රිස්තුස්වහන්සේගේ හිස ලෙස පිළිගන්නාවූ සැබෑ ඇදහිලිවන්තයින් පිරිසක්

ඇ. මන්දිරයක්

● ''සභාව'' යන්නට යේසුස්වහන්සේ පාවිච්චි කළේ කුමණ වචනයද?

අ. පිටතට කැඳවනු ලැබූ යනුවෙන් අදහස් වන්නාවූ ''එක්ලීසියා'' යන වචනය

ආ. ඉගෙන ගන්නන් නොහොත් අනුගාමිකයන් යනුවෙන් අදහස් වන්නාවූ ''ගෝලයන්'' යන වචනය.

ඇ. මන්දිරය යනුවෙන් අදහස්වන්නාවූ ''මන්දිරම්'' යන වචනය

● ඔබ කුමණ ආකාර සභාවකට අයිතිවීමට කැමති වන්නේද?

අ. බයිබලය පිළිගෙන එයට කීකරු වන එකකටය.

ආ. බයිබලය දේවානුභාවයෙන් ලියූ බව සැක කරන එකකටය.

ඇ. බයිබලය අනගි සාහිත්‍ය පොතක් ලෙස සළකන එකකටය.

### දෙවැනි කොටස

# සැබෑ සභාවෙහි කාර්යය කුමක්ද?

මෙතැන්හිදීත් තුන්වැනි කොටසෙහිදීත් ''සභාව'' යනුවෙන් අදහස් කරනුයේ ප්‍රාදේශීය හා ජාතික සභාවන් තුළින් ක්‍රියා කරන්නාවූ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නමැති ඇදහිලිවන්තයින් පිරිසයි.

**සැබෑ සභාව දෙවියන්වහන්සේට ප්‍රේම කරමින් උන්වහන්සේ උදෙසා ජීවත්වේ.**

අන් කිසි දෙයකට වඩා දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ අපේ ප්‍රේමයය. උන්වහන්සේගේ දරුවන්වී උන්වහන්සේගේ ප්‍රේමය භුක්ති විඳිමින් උන්වහන්සේට අප විසින් ප්‍රේම කිරීමට අපව සෑදූ සේක. සභාව නමස්කාර යේදී දෙවියන්වහන්සේව හමුවෙයි. එක්සත්වද තනි තනි වශයෙන්ද සභාවේ සාමාජිකයෝ යාච්ඤාව, ප්‍රශංසාව,

සංගීතය, ස්තුතිදීම, ක්‍රිස්තියානි සේවය හා උන්වහන්සේගේ නියමයන්ට කීකරුවීම තුළින් දෙවියන්වහන්සේට ඔවුන්ගේ ප්‍රේමය ප්‍රකාශ කරත්.

**සැබෑ සභාව යේසුස්වහන්සේ ගැන ලෝකයාට කියා දෙයි.**

සැම ක්‍රිස්තියානි කාරයෙක්ම ඔහුගේ පවුලේ අයටත් මිතුරන්ටත් ඔවුන් ගැළවෙන ආකාරය කියා දිය යුතුවේ. ලොව සැම පළාතකටම ශුභාරංචි පණිවුඩය ගෙනයෑම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ අපට උපකාර කරන සේක. මෙය කිරීම සඳහා සැබෑ සභාව එක්ව වැඩ කරයි.



**මෙය කටපාඩම් කරන්න**

**මාර්ක් 16 : 15**.................. ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා.

**ක්‍රියා 1 : 8** නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා ............... පොළවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය.

**මාර්ක් 5 : 19** ............... නුඹ ගෙදර නුඹේ නෑ මිතුරන් ළඟට ගොස් ස්වාමීන්වහන්සේ නුඹට කොප මණ මහත් දේවල් කළ සේක්ද කියා .................. ඔවුන්ට දන්වාපන්න.

**සැබෑ සභාව දෙවියන් වහන්සේගේ වචනය උගන්වයි.**

සභාව සාමාජිකයින්ට සත්‍යතාවය කියා දීමට සහ යේසුස්වහන්සේව අනුගමනය කිරීමට පුහුණු කිරීමටද හැකි සැම ක්‍රමයක්ම පාවිච්චි කරයි.



**මතෙව් 28 : 19,20,** එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතීස්ම (අවගාහනය) කරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්නට ඔවුන්ට උගන්වාපල්ලා.

**සැබෑ සභාව තම සාමාජිකයින් ගැන සැළකිලිමත් වේ.**

සභාව නමස්කාරයට, බයිබල් අධ්‍යාපනයට, සහභාගිකම පැවැත්වීමට සහ ක්‍රිස්තියානි සේවයට නියමිත පරිදි නොකඩවා රැස්වෙමින් සාමාජිකයින්ගේ ආත්මීක වර්ධනය සළස්වයි.

ගැටළු ඇති අයට සභාව උපදෙස් සහ උපකාර දෙයි. අවශ්‍යකම් ඇති සාමාජිකයින් හෝ සාමාජිකයින් නොවන අය යන දෙකොට්ඨාශයටම සභාව හැකි උපකාරයක් දෙයි.

**ඔබේ අභ්‍යාසය සඳහා**

- සැබෑ සභාව දෙවියන්වහන්සේට............... උන්වහන්සේ උදෙසා ...............
- සභාව යේසුස් වහන්සේ ගැන ............... කියා දෙයි.
- සභාව ............... උගන්වයි.
- සභාව දෙවියන්වහන්සේට ..................... රැස්වේ.
- සභාව ............... සළකා ඔවුන්ගේ ............ වර්ධනය සළස්වයි.

### තුන්වැනි කොටස

# සභාවකට අයත්විය යුත්තේ මන්ද?

**ඔබට සභාව අවශ්‍ය වන හෙයිනි.**

ඔබට උපකාර කරන පිණිසත් උගන්වන පිණිසත් දෙවියන්වහන්සේ සභාවෙහි මිනිසුන් පත්කර තිබෙන සේක. ඔබේ ආත්මීක අවශ්‍යතාවයන් මෙ අයුරින් උන්වහන්සේ පිරිමසනසේක.



එපිස 4 : 11,12,13 උන්වහන්සේ ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභා පාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. එසේ දුන්නේ අප සියල්ලන් ............... සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනයවීම පිණිසත්ය.

මුදලින් ආහාරවලින් හා අනිකුත් ද්‍රව්‍යමය අවශ්‍යතා ආදියෙන් ඔබට උපකාර ලබා ගැනීමේ අදහස ඇතිව සභාවකට නොබැඳිය යුතුය. දෙවියන්වහන්සේට ඔබේ ජීවිතයේ මුල් ස්ථානය දෙන විට උන්වහන්සේ ඔබේ අවශ්‍යතාවයන් පිරිමැසෙන්ට සළස්වන සේක.

**සභාවට ඔබ අවශ්‍යවන හෙයිනි.**

ශරීරයේ සෑම අවයවයකටම ඉටුකිරීමට වැඩ කොටසක් තිබේ. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහි සාමාජිකයෙකු වශයෙන් ඔබට කිරීම පිණිස වැඩ තිබේ. ශරීරය වෙනුවෙන් යමක් කිරීමට උත්සාහ කරන්නාවූ එහෙත් අතට නොබැඳී වෙන්ව සිටින්නාවූ ඇඟිල්ලක් නොවන්න. සභාව තුළ ඔබේ ස්ථානය ගෙන අන්‍යයන්ට උපකාර කිරීම පිණිස දෙවියන් වහන්සේට ඔබව පාවිච්චි කිරීමට ඉඩ දෙන්න.

**රෝම 12 : 4,6** ............... යම්සේ අපට එකම ශරීරයෙහි බොහෝ අවයව තිබෙන නුමුත් ඒ සියලු අවයවයන්ට එකම ක්‍රියාවක් නැතුවාක් මෙන් ...... ......... අපට දෙන ලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ............... අපට ලැබුණේය.



**සභාව තුළින් ඔබට දෙවියන් වහන්සේට වඩා හොඳින් සේවය කිරීමට හැකි වන හෙයිනි.**

ඔබ වතුරෙන් අවගාහනය (බෞතීස්මය) ලබා සභාවකට බැඳීම අන්‍යයන්ට යහපත් සාක්ෂියක්ද දෙවියන්වහන්සේට කීකරුකමෙහි හා කැපවීමෙහි ක්‍රියාවක්ද වේ. දෙවියන් වහන්සේ උදෙසා හැකි අයුරින් සම්මාදම් දෙමින්ද ඔබට උන්වහන්සේට සේවය කළ හැකිවේ. ඔබට එය වඩාත් හොඳින් කළ හැකිවන්නේ සභාවක් මාර්ගයෙනි. සභාව මුදල් ප්‍රවේශමෙන් පරිපාලනය කර සභාවට අයත් ප්‍රදේශයෙහි හා වෙනත් බොහෝ පළාත්වලට ශුභාරංචිය ගෙන යෑමේ වියදම දරයි. යමෙකු දුන් නිසා ඔබ ශුභාරංචිය අසන්නෙහිය. ඔබ දෙන නිසා අන්‍යයෝ අසා ගැළවීම ලබත්.



**2 කොරින්ති 9 : 6,7** .............. මේක කියමි. මසුරු ලෙස වපුරන්නා මසුරු ලෙස කපාගන්නේය. නොමසුරුව වපුරන්නා නොමසුරුව කපාගන්නේය. කණගාටුවෙන්වත් ඕනෑම නිසාවත් නොව එක් එක්කෙනා තම තමාගේ සිතින් නියමකර ගත් ලෙස දේවා. මක්නිසාද සතුටු සිතින් දෙන්නාට දෙවියන්වහන්සේ ප්‍රේමකරන සේක.

ක්‍රිස්තියානි සභාව තුළ ක්‍රිස්තියානි සේවයට බොහෝ අවස්ථා තිබේ. ඒවා යාච්ඤා කිරීම, සාක්ෂි දැරීම, පොත් පත්‍රිකා ආදිය බෙදහැරීම, ගායනය, ඉගැන්වීම, දේශනාකිරීම, අන්‍යයන් දේවස්ථානයට ගෙනඒම ආදියවේ. ඔබේ නොකඩවා පැමිණීම පවා දෙවියන්වහන්සේ සතුටු කිරීමටද, අන්‍යයන් ධෛර්යමත් කිරීමටද හේතුවේ.



**හෙබ්‍රෙව් 10 : 25** සමහරුන්ගේ පුරුද්ද ලෙස අපේම රැස්වීම අත්නැර ඒ දවස ළංවෙන බව තුඹලාට පෙනෙන ප්‍රකාරයට වඩ වඩා එකිනෙකාට අවවාද කරමු.

## ඔබේ අභ්‍යාසය සඳහා

- ඔබ ප්‍රාදේශීය සභාවක සාමාජිකයෙක්ද............
- එසේ නම් කුමණ සභාවෙහිද?..................
- අනිකුත් ක්‍රිස්තු භක්තිකයන් සමග ස්වාමීන් වහන්සේට නමස්කාර කිරීමට නියමිත පරිදි ඔබ රැස්වෙන්නෙහිද?...............
- ඔබ පළාතට කිට්ටුව ඇති හොඳම සභාවක ලිපිනයක් ලබාගැනීමට ඔබ කැමැත්තෙන් සිටින්නෙහිද?... .....................
- ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට ඇතුළත්වන අනිකුත් ක්‍රිස්තු භක්තිකයින් සමග වැඩ කිරීමට ඔබ කැමති වන්නෙහිද?...............

සතර වැනි කොටස

# සභාවට කුමක් සිදුවීගෙන යන්නේද?

## සියවස් විස්සක් මුළුල්ලෙහි සටනක්

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ සභාව පිහිටු කාලයේ සිටම සාතන් (යක්ෂයා) එය විනාශ කිරීමට තැත් කරමින් සිටී. සභාව සටන් කරනුයේ සිය පැවැත්ම ආරක්ෂා කර ගැනීමට පමණක් නොව සාතන් (යක්ෂයා) නිරයට ගෙන යනු ලබන්නාවූ ආත්ම බේරා ගැනීමටත් වේ.



**එපීස 6 : 12**............... අපේ පොර බැදීම වනාහී මාංශයට සහ රුධිරයට විරුද්ධව නොව ............ දූෂ්ඨකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය.

**1 පේත්‍රුස් 5 : 8** සිහි ඇතිව අවදිව ඉඳිල්ලා. නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයකු මෙන් කවරෙකු ගිලිම්දෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය.

## සාතන්ගේ යුද්ධ උපායන් හා ආයුධ

සාතන් (යක්ෂයා) ක්‍රිස්තියානිකාරයින් පරාජය කිරීම පිණිස ඔවුන්ව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන් කිරීමට තැත් කරයි. යක්ෂයාගේ ප්‍රධාන ආයුධ නම් පීඩා කිරීම, වැරදි ඉගැන්වීම් හා පරීක්ෂා කිරීම හෙවත් වැරදි කිරීමට පෙළඹවීම වේ. ඔහු පීඩා කිරීමෙන් සභාව නැතිකර දැමීමට උත්සාහ කරමින් දහස්ගණන් ක්‍රිස්තියානිකාරයින් මරණයට පත්කොට තිබේ. යක්ෂයා අසත්‍ය උගන්වන ගුරුවරු සභාවට ඇතුළු කොට සභාවේ සමහර නායකයින් සත්‍යය සම්බන්ධව අන්ධ කර තිබේ. යක්ෂයා පාපය සමඟින් සභාව විනාශ කිරීමට ද්‍රෝහි ක්‍රියාවන් කරයි.

## සභාවේ යුද්ධ උපායන් හා ආයුධ

අපේ ආරක්ෂා ක්‍රමය නම් අපගේ හමුදපතිතුමාණන් වන ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමග සම්බන්ධකම පැවැත්වීමවේ. අපේ ප්‍රධාන ආයුධ නම් යාච්ඤාව ඇදහිල්ල හා දෙවියන්වහන්සේගේ වචනයයි. යක්ෂයාට වඩා බලසම්පන්නවූ ශුද්ධාත්මයාණන්වහන්සේ යක්ෂයාව පරාජය කිරීමට අපට ශක්තියත් බලයත් දෙන සේක.



**එපීස 6 : 10,11** ............... ස්වාමීන්වහන්සේ තුළද උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහිද බලවත් වෙයල්ලා. යක්ෂයාගේ උපායවලට විරුද්ධව, සිටින්ට නුඹලාට පුළුවන් වන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳ ගනිල්ලා.

### සභාවේ ජයග්‍රහණය

කාල යුගයන් මුළුල්ලෙහි පීඩා විඳීම කරණකොටගෙන සභාව පිරිසිදුවී වර්ධනය වී තිබේ. පාපයෙනුත් අසත්‍ය උගැන්වීම් වලිනුත් සභාව මුදගැනීම පිණිස ශුද්ධාත්මයාණන් වහන්සේ නැවත නැවත පිබිදීම් එවසේක. දැනට අපට දුක් විඳීමට සිදු වුවද සටන විගසින් අවසන් වනවා ඇත. යක්ෂයා පරාජය කොට සභාව ක්‍රිස්තුස්වහන්සේ සමඟ සදහටම රජ කරනවා ඇත.



**මතෙව් 16 : 18** ............... මාගේ සභාව ගොඩනඟන්නෙමි. පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය.

**රෝම 8 : 37** ............... අපට ප්‍රේම කළාවූ තැනැන් වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෙමු.

### මේ සියල්ලේදී ඔබේ කොටස

මෙම සටනෙහිදී සෑම ක්‍රිස්තියානිකාරයෙකුම යුද්ධ භටයෙකි.



**2 තිමෝති 2 : 3** ක්‍රිස්තුස් වහන්සේගේ යහපත් භේවායෙකු මෙන් දුක්විඳීමට පංගුකාරයෙකු වෙයන්න.

**එළිදරව් 2 : 10** ............... භය නොවන්න ............... මරණය දක්වා විශ්වාසව සිටපන්න. එවිට මම ජීවනයේ ඔටුන්න තුඹට දෙන්නෙමි.

### ඔබේ අභ්‍යාසය සඳහා

- මෙම පාඩම් පෙළ උගෙනීමට ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ඔබ යේසුස්වහන්සේ ඔබේ ගැළවුම් කාරයාණන් හැටියට පිළිගෙන තිබුණෙහිද?
- එසේ නැතහොත් මෙය උගෙනීමට පටන් ගත් පසුව පිළිගත්තෙහිද?
- එසේ නැතහොත් ඔබ දැන් උන්වහන්සේ පිළිගන්නෙහිද?

---

ඔබ මෙම පාඩම් පෙළ අවසන් කළ නිසා අපි බොහෝ සතුටු වෙමු. අපේ ශිෂ්‍යයෙකු ලෙස ඔබව පිළිගැනීමට හැකිවීම ගැන අපි ප්‍රීතිමත් වෙමු. ඔබ මීළඟ පාඩම් පෙළ සඳහා මෙතෙක් ලියාපදිංචි වී නොමැති නම් ඔබ එය දැන් කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ඔබේ සහතිකයෙහි යඳහන් විය යුතු ආකාරයට ඔබේ නම මෙහි පහත සඳහන් කරන්න.

නම :..............................................

# පුද්ගලික සාක්ෂිය

ඔබ මෙම පාඩම් ඉගෙනගන්නා අතර දෙවියන් වහන්සේගේ ආශීර්වාදය පතා අපි ඔබ උදෙසා යාච්ඤා කෙළෙමු. දැන් ඔබ මෙය අවසාන කළාක් මෙන් එය ඔබට උපකාර වූ සැටි දැනගැනීමට අපි කැමැත්තෙමු. මින් එක පාඩමක් හෝ ඔබට විශේෂ ලෙස උපකාර වුණේද? ඒ කුමක්ද? ඒ කෙසේද?

ඔබේ නම :.................................................

ලිපිනය :.................................................

.................................................

පහත සඳහන් ලිපිනයට ලියන්න.

# ජීවිතය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න

පාඩම් පෙළ

1 ලෝකයට සිදුවීගෙන යන්නේ කුමක්ද?

2 දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යය කුමක්ද?

3 ජීවිතය යනු කුමක්ද?

4 ඔබේ වැදගත්ම අවශ්‍යතාවය සපුරාගන්නේ කෙසේද?

5 මරණින් පසු කුමක් සිදුවේද?

6 සැබෑ ක්‍රිස්තියානි සභාව කුමක්ද?


අපේ ලිපිනය
ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය
තැ. පෙ. 102,
කොළඹ.